# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 14,542 — 1965 ඔක්තෝබර් 25 වැනි සඳුද — 1965.10.25**

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී.)


# IV වැනි කොටස—පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## පළාත් පාලන නිවේදන

ඇල්.ඩී.—බී. 3/65.

### මහා නගර සභා ආඥාපනත

**2, 5, 6 සහ 9 වැනි වගන්ති යටතේ වූ ආඥාව**

(252 වැනි අධිකාරය වන) මහා නගර සභා ආඥාපනතේ 2, 5, 6 සහ 9 වැනි වගන්ති වලින් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවනු ලැබූ ආඥාවයි.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති.

1965 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

රත්නපුර නගරය සඳහා මහා නගර සභාවක් සංස්ථාපනය කිරීම සම්බන්ධයෙන් 1965 මාර්තු 26 වැනි දින අංක 14,359 දරන ගැසට් පත්‍රයෙහි පළවූ ආඥාව මෙයින් අවලංගු කරනු ලැබේ.

10–1168/1

---

ඇල්.ඩී.—බී. 3/65.

### නගර සභා ආඥාපනත

(255 වැනි අධිකාරය වන) නගර සභා ආඥාපනතේ 10 වැනි වගන්තියෙන් තමා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර පළාත් පාලන ඇමතිවරයා විසින් පනවන ලද ආඥාව.

ඇම්. තිරුචෙල්වම්,
පළාත් පාලන ඇමති

1965 ඔක්තෝබර් මස 25 වැනි දින,
කොළඹ දී ය.

### ආඥාව

රත්නපුර නගර සභාවේ දනට නිලයේ සිටින සභික වරුන්ගේ නිල කාලය අවසාන විය යුතු දිනය වශයෙන් 1965 දෙසැම්බර් මස 31 වැනි දිනය වෙනුවට 1966 ජූනි 30 වැනි දිනය මෙයින් නියම කරනු ලැබේ.

10–1168/2


ලංකාවේ වැලව්වේනයෙහි පිහිටි "ඊස්ටර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රාපිතයි.

805——ආර් 8067—5,025 (65/8)